විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம் " கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No. : විවැ. චක්‍රලේඛ/2006.

ඔබේ අංකය / உமது இல. / Your No. :

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date : 2006.03. 20

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2006.
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
ත්‍රිවිධ හමුදාපතිවරුන් වෙත.

## 1970 අංක 18 දරණ වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත.

1968.09.30 හෝ එදිනට පෙර සේවයට බැඳුනු හා එම දිනයට පසුවද සේවය කරන ලද සන්නද්ධ හමුදා සාමාජිකයින්ට ඉහත පනතේ 3 වන වගන්තිය පරිදි සන්නද්ධ සේවා වැන්දඹු අනන්දරු ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා මනාපය පළකිරීමට අවස්ථාව ලබා දී තිබුණි.

02. එම අවස්ථාවේදී මනාපය පළ නොකල හමුදා සාමාජිකයින්ට අවසාන වශයෙන් මනාපය පළ කිරීමේ දිනය 2001 ජූනි මස 30 වන දින ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2000.07.07 දිනැති ගැසට් පත්‍රය මගින් දීර්ඝ කර තිබුණි.

03. එහෙත් මේ වන විටත් අදාල මනාපය පළ නොකිරීම නිසා අසරණ භාවයට පත් හමුදා වැන්දඹුවන් සැලකිය යුතු පිරිසක් තමන්ට වැන්දඹු විශ්‍රාම වැටුපක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලුම් කර ඇත.

04. මෙම ඉල්ලීම පිළිබඳව සලකා බලා ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් 2006.02.10 දිනැති ගැසට් නිවේදනය මගින් මෙම මනාපය පළ කිරීමේ දිනය 2006 ජූනි මස 30 දින ලෙස දීර්ඝ කොට තිබේ. එහි පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි.

ඒ අනුව පහත සඳහන් නිලධාරින්ට මෙම මනාපය පළ කළ හැකිය.

1. දැනට සේවයේ යෙදී සිටින මනාපය පළ කිරීමට කැමති නිලධාරීන්,
2. දැනට විශ්‍රාම ලබා ඇති මනාපය පළ කිරීමට කැමති නිලධාරීන්,
3. මනාපය පළ කිරීමට දී ඇති අවසාන දිනයට පෙර මියගොස් ඇති නිලධාරීන්, (මෙහිදී වැන්දඹු භාර්යාව හෝ අනන්දරුවන් / අනන්දරුවන්ගේ භාරකරුවන් ලවා ආකෘති පත්‍රය අත්සන් කළ හැකිය.)

05. මෙම දින දීර්ඝ කිරීම යටතේ සන්නද්ධ හමුදා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වීමට හිමිකම් ඇති තැනැත්තන් නියමිත ආකෘති පත්‍ර ත්‍රිවිධ හමුදාවලට අදාල වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ කාර්යාල වලින් ලබා ගෙන නියමිත පරිදි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම කාර්යාල වලට බාරදිය යුතුවේ.

05.1 විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තීරණය කරන යම් තැනැත්තෙකු විසින් හෝ විශ්‍රාම ක්‍රමයේ දායකයන් වීමට තීරණය කලේ යැයි සළකනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් වන විට ඒ මියගිය තැනැත්තාගේ වැන්දඹුව හෝ අනත්දරුවන් විසින් 1968 ඔක්තෝම්බර් මස 01 වන දිනයෙන් ආරම්භ වන අවස්ථාවෝචිත පරිදි තීරණය කිරීමේ, විශ්‍රාම ගැනීමේ හෝ මරණය සිදුවීමේ දිනය තෙක් වන කාලය සඳහා හිග දායක මුදල් සහ ඒ මත වර්ෂයකට සියයට හතරක අනුප්‍රමාණය අනුව පොළිය විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවිය යුතුය.

06. මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ විශ්‍රාමික සංගම්, විශ්‍රාමික නිලධාරීන් හා විශ්‍රාමික හමුදා නිලධාරීන්ගේ වැන්දඹුවන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඒ. තිලකරත්න.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ.

පිටපත්:-

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්.
2. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
3. ලේකම්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.